# ඉතිහාසය ලිවීම

මෙරට ඉතිහාසය විවිධාකාරයෙන් ලිවීම සඳහා විවිධ පුද්ගලයන් කැසකවනු දක්නට හැකි ය. භාරතයෙන් අර්ධ වෛදිකයන් මෙහි පැමිණීමට පෙර සිටි ගෝත්‍රිකයන් කවදා මෙරටට පැමිණියේ දැයි අපට නිශ්චිත ව කිව නොහැක්කේ ඒ සඳහා අවශ්‍ය තරම් සාධක නොමැති බැවින් ය. එසේ වුවත් අඩුම තරමින් අවුරුදු විසිපන්දාහක් මෙරට මිනිසුන් ජීවත් වී ඇති බවත් ඔවුන් යම් කෘෂිකර්මයක යෙදුණ බවත් පැහැදිලි ය. ඇතැමුන්ට අවුරුදු විසිපන්දාහකට ඉහත දී ද මෙරට හෙළයන් (සිංහලයන්) වාසය කළ බව කීමේ අවශ්‍යතාව වෙයි.

මුළු ලෝකයට ම ශිෂ්ටාචාරය හා සංස්කෘතිය හඳුන්වාදුන්නේ හෙළයන් යැයි කීමට ඇතැමුන්ට අවශ්‍ය වෙයි. සමහරවිට ඒ එසේ විය හැකි ය. එහෙත් එසේ කීම සඳහා අපට අවශ්‍ය තරම් සාධක නැත. ඇතැමුන් එසේ කියන්නේ ඉතාමත් අවංකව ය. ඔවුහු ඒ බව විශ්වාස කරති. ඒ සඳහා ජනප්‍රවාදයෙහි හා රාමායණය වැනි ග්‍රන්ථවල ඇති කරුණු යොදාගනිති. ඒ කරුණුවලට විවිධ අර්ථකථන දෙති. එහෙත් මේ කරුණු බොහොමයක් විෂ්ණු පුරාණය වැනි වෛදික හා හින්දු ග්‍රන්ථවලින් ලබාගැනීම තරමක ප්‍රශ්නයකි.

ලංකාවේ ඉතිහාසයේ සැකිල්ලක් යනුවෙන් කුඩා ග්‍රන්ථයක් පළකළ පොන්නම්බලම් අරුණාශලම් මහතා එවැනි පැරණි ග්‍රන්ථවලින් කරුණු උපුටා දක්වයි. ඒ මහතාට අවශ්‍ය වුයේ මෙරට අතීතයේ සිට දෙමළ ජනයා වාසය කළ බව කීමට ය. එහෙත් ඔහු ඒ බව කෙලින් ම නො කීවේ ය. අප විසින් අර්ධ වෛදිකයන් ලෙස හඳුන්වනු ලබන්නන් ලංකාවට ඒමට පෙර මෙරට වාසය කෙළේ ද්‍රවිඩ ජනයා යැයි කීමට දෙමළ ජනයාට අවශ්‍යතාවක් වෙයි. එපමණක් නොව ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර එහි වාසය කෙළේ ද ද්‍රවිඩයන් බව ලංකාවේ දෙමළ ජනයා හා ඉන්දියාවේ දෙමළ ඇතුළු ද්‍රවිඩ ජනයා පමණක් නොව මෙරට සිටින ඇතැම් මාක්ස්වාදී පඬියෝ ද කියති.

මේ පඬියන් හා අනෙක් එවැනි මතධාරීන් උපකල්පනය කරන්නේ ආර්යයන් (ජනවාර්ගික අර්ථයකින් ම විය යුතු නොවේ. ආර්ය යන්නෙන් මූලික වශයෙන් ගත්කල සංස්කෘතියක් හැඳින්වෙයි.) දඹදිවට පැමිණීමට පෙර එහි සිටියේ ද්‍රවිඩ ජනයා බව ය. මේ මතය ප්‍රචාරය කරන්නන්ට ආර්ය නොවේ ය යන්නෙන්, එනම් අනාර්ය යන්නෙන්, ද්‍රවිඩ යන්න හැඳින්වෙයි. අනාර්ය යන්නෙන් ආර්ය ද නොවන ද්‍රවිඩ ද නොවන ජනකායක් හැඳින්විය හැකි බව ඇරිස්ටෝටලීය න්‍යායෙහි සිර වූ මොවුන්ට වටහාගැනීමට නො හැකි ය.

ලංකාවේ ද දඹදිව ද එකල, එනම් ආර්යාගමනයට පෙර පැවති බවට සාක්ෂි ඇති සොහොන් තැනීම (අළුබඳුන් තැන්පත්කිරීම), මාතෘදේව වන්දනාව ආදිය ද්‍රවිඩ සංස්කෘතියට අයත් යැයි මේ පඬියෝ විශ්වාස කරති. එහෙත් ඒ විශ්වාසයක් හා උපකල්පනයක් ම පමණකි. ලංකාවේ පොම්පරිප්පුවේ හමු වූ සොහොන්වලින් ගම්‍යවන්නේ මෙරට ද්‍රවිඩ සංස්කෘතියක් තිබු බව යැයි පැවසීමට ඔවුහු උත්සාහ කරති. එහෙත් බුදුන් වහන්සේගේ ද ධාතුන්වහන්සේ නිධන්කරනු ලැබිණි. ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර තිබු සංස්කෘතියෙහි ඇතැම් අංග පසුව එහි පැමිණි ද්‍රවිඩයන් විසින් ද අනුගමනය කෙරී ඇත. ඉන් කියැවෙන්නේ ප්‍රාග් ආර්ය සංස්කෘතිය ද්‍රවිඩ සංස්කෘතියක් බව නො වෙයි.

මේ පඬියන් එතරම් අවබෝධයකින් තොරව මොහෙන්ජදාරෝ හරප්පා සංස්කෘතීන් ද ද්‍රවිඩ සංස්කෘතීන් යැයි කියනු දැකි ය හැකි ය. ඒ සියල්ලට මුල අනාර්ය යනු ද්‍රවිඩ ලෙස ගැනීම ය. ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ අර්ධ වෛදිකයන් ලංකාවට පැමිණි අවධියෙහි බවට සාක්ෂි ඇත. ඔවුන් එහි පැමිණ ඇත්තේ බටහිර ආසියාවෙනි. ඒ එන අතර ඔවුන්ගෙන් යම් පිරිසක් අද පකිස්ථානය නමින් හැඳින්වෙන ප්‍රදේශය අසල බ්‍රැහි පදිංචි වී ඇත. එහි අදත් ඔවුන්ගෙන් පැවතෙන්නෝ ද්‍රවිඩ භාෂාවක් කතාකරති.

අර්ධ වෛදිකයන් ලංකාවට පැමිණීමට පෙර මෙහි විසු ජනයා පිළිබඳ ඉතා උනන්දුවෙන් කතාකරන පිරිස අතර දෙමළ ජනයා ද සිංහලයෝ ද වෙති. දෙමළ ජනයාට අවශ්‍යවන්නේ විජය රජුගෙන් සංකේතවත්වන සංක්‍රමණයෙන් පෙර මෙහි විසු ජනතාව දෙමළ බව කීම ය. සිංහලයන්ගේ අරමුණ ඒ පිරිස හෙළයන් බව කීම ය. එහෙත් මේ

© Prof. Nalin De Silva

www.kalaya.org

දෙකොටසට ම ඒ සඳහා සංගත ව සාධක ඉදිරිපත්කළ නො හැකි ය. ඒ කෙසේ වෙතත් ඔවුන් කරන්නේ කුමක් ද යන්න අනෙක් සියල්ලන්ට ම පාහේ තේරුම්ගත හැකි ය.

එහෙත් මේ අතර වෙනත් අරමුණක් ඇතිව කටයුතු කරන කිහිප දෙනෙක් වෙති. ඔවුන්ගේ අවශ්‍යතාව වෙනම ම දෙයක් වෙයි. ඔවුන්ට අවශ්‍ය දත්ත සැපයෙන්නේ ඇමරිකාවේ ප්‍රසිද්ධ විශ්වවිද්‍යාලයකින් බව පැහැදිලි ය. ඒ විශ්වවිද්‍යාලයෙහි සිංහල භාෂාව අධ්‍යයනය කරන බටහිර විද්වත්තු වෙති. ඔවුන්ගේ අරමුණ මෙරට ඉතිහාසයෙහි, එනම් සිංහල බෞද්ධ ඉතිහාසයෙහි බුදු දහමට හිමි තැන නැතිකිරීම ය. මෙරට සංස්කෘතියෙහි යක්ෂ ආදී ගෝත්‍රිකයන්ගේ සංස්කෘතික ලක්ෂණ වෙයි. විශේෂයෙන් ම එහි ලා යක්ෂ සංස්කෘතියෙහි බලපෑම අනෙක් ගෝත්‍රික සංස්කෘතීන්හි බලපෑමට වඩා වැඩි ය.

එසේ වුවත් සිංහල සංස්කෘතියට බෞද්ධ සංස්කෘතිය අවශෝෂණය කරගැනීමෙන් සිංහල බෞද්ධ සංස්කෘතියක් නිර්මාණය කිරීමේ ප්‍රතිඵලය වූයේ බෞද්ධකම මෙරට සංස්කෘතියෙහි ප්‍රධාන අංගය වූ බව ය. මෙහි දී අප අමතක නොකළ යුතු කරුණ නම් සිංහල සංස්කෘතිය ද බෞද්ධ සංස්කෘතිය ද අර්ධ වෛදික සංස්කෘතීන්හි පදනම් වන බව ය. එබැවින් සිංහල සංස්කෘතියට බෞද්ධ සංස්කෘතිය අවශෝෂණය කිරීම මාළුවා දියට දැමීමක් විය. අපි මේ පිළිබඳ ව කලින් සාකච්ඡා කර ඇත්තෙමු.

අර කිහිප දෙනාගේත් ඇමරිකන් විශ්වවිද්‍යාලයේත් අවශ්‍යතාව වී ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතිය හුදු සිංහල සංස්කෘතියක් බවට පත්කර බෞද්ධකම ඉන් මකා දැමීම ය. එහෙත් ඔවුහු ර් බව ප්‍රසිද්ධියේ නො කියති. මෙහි දී ඔවුන්ගේ අරමුණට විරුද්ධව යන්නේ මහාවංශය හා සෙල්ලිපි ය. එබැවින් සෙල්ලිපි පිළිබඳ වෙනත් අර්ථකථන දීමට ඔවුහු දැන් කටයුතු කරගෙන යති. එමෙන් ම මහාවංශය ද විකෘති කිරීම ඔවුන්ගේ අභිලාෂය වෙයි.

මේ පුද්ගලයෝ මෑතක් වන තුරුම මහාවංශය විවේචනය නො කළහ. ඒ වෙනුවට ඔවුහු කොඩ්රිංටන් හා ගෙගර් යන පඬිවරුන්ට පහර එල්ල කළහ. මේ බටහිර උගතුන් පදනම් වූයේ මහාවංශය හා සෙල්ලිපි මත ය. මහාවංශයෙන් කියැවෙන ඉතිහාසය නිතර ම පාහේ සෙල්ලිපිවලින් කියැවෙන ඉතිහාසය සමග සංගත විය. කොඩ්රිංටන් ඉතිහාසයක් විවේචනය කරන බව මුල දී පවසමින් මේ පුද්ගලයන් කෙළේ මහාවංශයට පහර දීම ය. අද තව දුරටත් මේ පහර දීම හැංගි හොරා කරගෙන යෑමට නොහැකි තත්වයකට පත් වී ඇත. එබැවින් ඔවුහු අද එළිපිටම මහාවංශයට පහර දෙන්නේ සෙල්ලිපිවලට විකෘති අර්ථකථන සපයමිනි.

මොවුන් කොඩ්රිංටන් ඉතිහාසයක් ගැන මුලින් ම සඳහන් කෙළේ ඔහු ඉංගිරිසි කාරයකු බැවින් ඉංගිරිසින්ට අවශ්‍ය ආකාරයට ඉතිහාසය ලියා ඇති බව කියමිනි. එහෙත් කොඩ්රිංටන් හෝ ගෙගර් හෝ එලෙස බටහිරයන්ට අවශ්‍ය ඉතිහාසයක් ගොඩ නැඟී යැයි කිව නො හැකි ය. ඔවුන්ගේ ඉතිහාසය බොහෝ විට මහාවංශය හා සෙල්ලිපි සමග එකඟ විය. බටහිරයන් අතින් ලියැවුණු පමණින් යම්කිසි දැනුමක් බටහිර සංස්කෘතියෙහි නිපන් දැනුමක් බවට පත් නොවෙයි. එහෙත් අද මේ පුද්ගලයන් කිහිප දෙනා අතින් නිර්මාණය වන දැනුම නම් බටහිරයන්ට අවශ්‍ය වූවකි.

බටහිර විද්‍යාව, බටහිර දැනුම ආදියෙන් අප අදහස් කරන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම් කරගනිමින් නිර්මාණය කෙරෙන විද්‍යාවකි, දැනුමකි. එය දැනුම නිර්මාණය කරන්නාගේ ජාතිය ජනවර්ගය හෝ වෙනත් එවැන්නක් මත පදනම් නො වෙයි. කොඩ්රිංටන්ගේ ජාතිය කුමක් ද යන්න මෙහි දී ප්‍රශ්නයක් නො වෙයි. ඔහු මහාවංශය හා සෙල්ලිපි පදනම් කරගනිමින් සංගත ව ඉතිහාසයක් ලියා ඇත්නම් ඒ ඉතිහාසය සිංහල බෞද්ධ ඉතිහාසයක්, දැනුමක් ලෙස පිළිගැනීමට අපට බාධාවක් නැත.

අනෙක් අතට තමා සිංහලයකු බව කියන්නකු පමණක් නොව සිංහලයෙහි ආරක්ෂයකු ගැලවුම්කරුවකු යැයි අනෙක් අයට ඇඟවෙන පරිදි ක්‍රියාකරන්නකු ඇමරිකන් විශ්වවිද්‍යාලයක් මගින් සැපයෙන තොරතුරු ඔස්සේ බටහිරයන්ට අවශ්‍ය ඉතිහාසයක් ලියන්නේ නම් ඒ ඉතිහාසය බටහිර යුදෙව් ක්‍රිස්තියානි දැනුමක් ලෙස අපට වර්ගීකරණයට ලක්කිරීමට සිදුවෙයි. මෙවැන්නන් ඉංගිරිසි ජාතිකයකු යැයි කියමින් කොඩ්රිංටන්ට පහර දෙන්නේ අද ඔහු ජීවතුන් අතර නැති නිසා විය හැකි ය! කෙසේ හෝ එමගින් අවුරුදු විස්සකට පමණ පසුව හෝ මේ අයගේ සැබෑ සිංහල

© Prof. Nalin De Silva

බෞද්ධ විරෝධී ආකල්ප හා ප්‍රතිචාර හෙළිවීම නම් රටට සිදුවන සේවයකි. හැංගි හැංගි වෙස් බැන්දත් නටන්නට සිදුවන්නේ එළියේ ය යන්න සිංහල සංස්කෘතියෙහි ඇති කියමනකි.

බටහිර ජාතිකයකු බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය කරන දැනුමක් වුවත් සිංහල සංස්කෘතියට අවශෝෂණය කිරීමට හැකිනම් අපි එයට විරුද්ධ නො වෙමු. අප විරුද්ධවන්නේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි ඇති බටහිර දැනුම් ආධිපත්‍යයට ය. බටහිරයන්ගේ දැනුම අප මත බලෙන් පැටවීමට අපි විරුද්ධ වෙමු. බටහිර දැනුම අනුකරණය කරමින් ඒ බෙදාහරිණ  ඇංකර උගතුන්ට අපි විරුද්ධ වෙමු. මේ අනුකාරකයන් දැනුම බෙදාහරින්නේ ඇතැම් සමාගමක් ඇංකර් පිටි බෙදාහරින්නාක් මෙනි.

අපේ ඈත ඉතිහාසය ගැන තව තවත් සාධක ලැබෙන තුරු ඒ ගැන ප්‍රවාද  ගොඩ නැගීමට කටයුතු නොකිරීම වැදගත් ය. පැරණි සිංහලයෝ රාමායණය වැනි පොත පත බැහැර කළහ. ඒ පොත්වල යථාර්ථවාදය නොමැති නිසා ඒ ප්‍රතික්ෂෙප කෙරිණිය යන්න බටහිර යථාර්ථවාදය මෙරට බෙදාහැරීම සඳහා ඉමහත් වෙහෙසක් ගත් මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ අදහස ය. එසේ නම් සිංහලයන් ජාතක කතා ද ප්‍රතික්ෂෙප කළ යුත්තේ එහි ද ඊනියා යථාර්ථවාදයක් නොමැති නිසා ය. එසේ නම් පැරැන්නන් රාමායණය වැනි පොත් බැහැර කෙළේ ඇයි? අපේ ඉතිහාසය ගැන කතාකරන විට අපට ඒ ප්‍රශ්නයට ද මුහුණ දීමට සිදුවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva